ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2020 අප්‍රේල් 27 |

## බලපත්‍රලාභී බැංකු මගින් ලබා දෙන රන් භාණ්ඩ උකස් අත්තිකාරම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් උපරිම පොලී අනුපාත නියම කරයි.

රන් භාණ්ඩ උකස් අත්තිකාරම් සඳහා බලපත්‍රලාභී බැංකු විසින් දැනට අය කරනු ලබන වාර්ෂික පොලිය 12% - 17.5% දක්වා පරාසයක පවතින බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරීක්ෂණය කර ඇත. කොවිඩ්-19 වසංගතය නිසා ඇතිවූ අයහපත් ආර්ථික තත්ත්වය හමුවේ, තම කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා රන් භාණ්ඩ උකසට තබන අඩු ආදායම්ලාභීන්ට සහනයක් සැලසීමේ අවශ්‍යතාවය සලකමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී බැංකු වල රන් භාණ්ඩ උකස් අත්තිකාරම් පහසුකම් සඳහා උපරිම පොලී අනුපාත සීමා පැනවීමට තීරණය කර ඇත.

ඒ අනුව, 2020 අප්‍රේල් 27 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, බලපත්‍රලාභී බැංකු මගින් පුද්ගලික ස්වර්ණාභරන සුරැකුම් ලෙස තබා ගනිමින් මුදල් ණයට දීමේදී අය කල හැකි උපරිම පොලී අනුපාතය වසරකට 12% හෝ වසරකට අඩු කාලයක් සඳහා ලබා දෙන උකස් අත්තිකාරම් සඳහා මසකට 1% ක උපරිමයකට සීමා කරමින් මුදල් නීති පනත යටතේ නියෝගයක් නිකුත් කරන ලදී. මෙම උපරිම පොලී අනුපාත, මෙම නියෝගය ක්‍රියාත්මක වන දින සිට අළුතින් ලබා දෙන උකස් අත්තිකාරම්වලට සහ දැනට පවතින උකස් අත්තිකාරම් එදින සිට නැවත අළුත් කිරීමේදී අදාළ වේ.

තවද, රන් භාණ්ඩ උකස් සේවා සපයන අනෙකුත් ආයතනද සිය ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ හදිසි මූල්‍ය අවශ්‍යතා දැරිය හැකි පිරිවැයකින් සපුරාගැනීමට සහ පසු කාලීනව එම උකසට තබන ලද ස්වර්ණාභරන බේරා ගැනීමට හැකි වන පරිදි අඩු පොලියකට උකස් ණය පහසුකම් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.